# ගෝලීය අරමුදලෙහි ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ කමිටුවේ විධායක ලේකම් / අධීක්ෂණ නිලධාරී තනතුර සඳහා කෙටුම්පත් පුරප්පාඩුව (කොන්ත්‍රාත් පදනම)

ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ කමිටුවේ (CCMSL) විධායක ලේකම් / අධීක්ෂණ නිලධාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා විසින් අයදුම්පත් කැඳවයි. ඒඩ්ස් රෝගය, ක්ෂය රෝගය සහ මැලේරියාව පිටුදැකීම සඳහා වූ ගෝලීය අරමුදලින් (GFATM) එම රෝග පාලනය කිරීම පිණිස ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ කමිටුව ආධාර මුදල් ලබයි.

**රාජකාරි :**

විධායක ලේකම් / අධීක්ෂණ නිලධාරී දේශීය සම්බන්ධීකරණ කමිටු ලේකම් කාර්යාලයට නායකත්වය දෙන අතර දේශීය සම්බන්ධීකරණ කමිටිටුවට සහ එහි නායකත්වයට වගකිව යුතු ය. වසංගත ලෙස පවතින මෙම රෝග 2030 වන විට අවසන් කිරීම පිළිබඳ ඉලක්කය හඹා යන ජාතික රෝග ක්‍රමෝපායයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට විධායක ලේකම් / අධීක්ෂණ නිලධාරී දේශීය සම්බන්ධීකරණ කමිටුවට මෙම නිලධාරියා ඉහළ සහාය දක්වයි. එසේම ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ කමිටුවේ විධායක ලේකම් / අධීක්ෂණ නිලධාරී ඉහළ මට්ටමේ ප්‍රවීණ දේශපාලන සහ තාක්ෂණික කුසලතා සහිත ඵලදායී පාලන යාන්ත්‍රණයක් උපයෝගී කරගනිමින් දේශීය සම්බන්ධීකරණ කමිටුවෙහි කාර්යයන්ට පහසුකම් සපයයි. මෙම නිලය විසින් දේශීය සම්බන්ධීකරණ කමිටු ලේඛන එකතුවක් පවත්වාගෙන යන්නේ ය. සාමාජිකයන් අතර ආරවුල් පැන නගින කාරණා වල දී මැදිහත් වෙනවා මෙන්ම ජාතික පාර්ශවකරුවන් සහ ගෝලීය අරමුදල් ලේකම් කාර්යාලය අතර සම්බන්ධතාවය පවත්වා ගනිමින් කටයුතු කරයි.

අධීක්ෂණ කාර්යයට සහාය වීම සම්බන්ධයෙන් තනතුරේ විශේෂිත අරමුණු වනුයේ:

1. පරිණාමීය ප්‍රවේශ ලක්ෂ්‍යය (Evolution threshold) තක්සේරුවේ දී හඳුනාගෙන ඇති අධීක්ෂණ කාර්යයේ ගැටලු විසඳීමට දේශීය සම්බන්ධීකරණ කමිටුවට සහාය වීම
2. විශ්ලේෂණාත්මක දත්ත පදනම් කරගත් සාකච්ඡා පවත්වා තීරණ ගැනීමට පහසුකම් සැලසීම සහ සහාය ලබාදීම.
3. අධීක්ෂණ සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීම
4. දේශීය සම්බන්ධීකරණ කමිටුවෙහි අධීක්ෂණ කමිටුවට තාක්ෂණික සහ පරිපාලන සහාය ලබා දීම

**වගකීම්වල ප්‍රධාන ක්ෂේත්‍ර :**

| | |
|---|---|
| මූලික කාර්යය 1: මෙහෙයුම් | - දේශීය සම්බන්ධීකරණ කමිටු ලේකම් කාර්යාලයට මඟපෙන්වීම සහ එහි මෙහෙයුම් ව්‍යුහයන්ට සහාය ලබා දීම |
| මූලික කාර්යය 2: අධීක්ෂණ | - පරිණාමීය ප්‍රවේශ ලක්ෂ්‍යය (Evolution threshold) තක්සේරුවේදී හඳුනාගත් දුර්වලතා ආමන්ත්‍රණය කිරීමේ අරමුණින් අධීක්ෂණ ක්‍රියා පටිපාටිවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම |
| මූලික කාර්යය 3: ස්ථානගත කිරීම | - දේශපාලනමය සාකච්ඡා සඳහා පහසුකම් සැලසීම සහ තිරසාර උත්සාහයන් ශක්තිමත් කිරීම |
| මූලික කාර්යය 4: නියැලීම | - පරිණාමීය ප්‍රවේශ ලක්ෂ්‍යය (Evolution threshold) තක්සේරුවේදී හඳුනාගත් දුර්වලතා ආමන්ත්‍රණය කිරීමේ අරමුණින් ප්‍රධාන පාර්ශ්වකරුවන් ගේ අර්ථවත්, ඇතුළත් සහ ක්‍රියාකාරී සහභාගිත්වය පෝෂණය කිරීම |

**සුදුසුකම් :**

මහජන සෞඛ්‍යය, මූල්‍ය, රාජ්‍ය පරිපාලන හෝ ව්‍යාපාර පරිපාලන හෝ වෙනත් අදාළ ඕනෑම ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම් සහිත වෛද්‍ය උපාධිධාරියෙකු (පිළිගත් දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් සමත් වූ) වඩාත් සුදුසු ය.

**පළපුරුද්ද:**

1. මානව සම්පත් අංශයේ සැලසුම් සහ කළමනාකරණ කටයුතුවල (දේශීය හෝ විදේශීය) අවම වශයෙන් වසර 7ක සේවා පළපුරුද්ද
2. දේශපාලන පරිසරයන් තුළ හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම සහ දේශීය, කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමින් සංකීර්ණ ගැටලු සහ බෙදාහැරීම් (Deliverables) සම්බන්ධ ශක්තිමත් අත්දැකීම්
3. උපාය මාර්ග සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය, වැඩසටහන් සැලසුම් සහ කළමනාකරණය සහ/හෝ ඊට සමාන අත්දැකීම් පිළිබඳ සේවා වාර්තාවක් ඇතුළු ඉහළ මට්ටමේ වෘත්තීය අත්දැකීම්
4. ක්‍රමෝපායික, ආයතනික, මූල්‍ය සහ සහ කළමනාකරණ ගැටලු පිළිබඳ ස්ථිර අවබෝධය සහ අත්දැකීම්
5. ගෝලීය අරමුදල් ක්‍රියාවලිය සහ එහි අරමුදල් ආකෘතිය පිළිබඳ ඉතා හොඳ අවබෝධයක් තිබීම
6. මූලික ප්‍රජාවන්ගේ / රෝගීන් සමඟ ජීවත්වන්නවුන්ගේ ක්‍රමෝපායික වටිනාකම පිළිබඳව සහ එය අර්ථවත් ආකාරයකින් ක්‍රියාවට නැගීම පිණිස අවශ්‍ය විශේෂිත උත්සාහයන් පිළිබඳව හොඳ අවබෝධයක් තිබීම
7. එච්. අයි. වී. / ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව කෙරෙහි අවධානය යොමු කරමින් මහජන සෞඛ්‍යය සහ රෝග වැඩසටහන් කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද
8. විශිෂ්ට පරිගණක සාක්ෂරතාව, සිංහල සහ/හෝ දෙමළ ව්‍යක්තභාවය සමඟ ඉහළම ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය, සහ ඔප්පු කළ හැකි ශක්තිමත් (ලිඛිත සහ වාචික) සන්නිවේදන කුසලතා අවශ්‍ය ය.
9. කණ්ඩායමක් කළමනාකරණය කිරීමේ ලේඛනගත අත්දැකීම්

**වයස් සීමාව සහ වැටුප් :**

- වයස - විවෘත
- වැටුප් - මාසිකව රු. 250,000/= + ප්‍රවාහන දීමනාව

**පොදු කොන්දේසි :**

- රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය ආයතනයක සේවය කරන නිලධාරීන් තමන්ගේ අයදුම්පත්‍ර තමතමන්ගේ ආයතන ප්‍රධානීන් හරහා එවිය යුතු ය.
- මෙම තනතුර කොළඹ දේශීය සම්බන්ධීකරණ කමිටු ලේකම් කාර්යාලයේ ස්ථානගත කෙරේ.
- මාස 06 ක පරිවාස කාලයක් සහිතව ආරම්භක කොන්ත්‍රාත් කාලය වසරක් සඳහා වන අතර කොන්ත්‍රාත්තුව අලුත් කරගැනීමේ ප්‍රතිපාදන ඇත. වාර්ෂික කාර්යසාධන ඇගයුමට අනුව අවශ්‍ය තරම් අරමුදල් තිබේ නම් වසර තුනක් දක්වා කොන්ත්‍රාත්තුව දිගු කිරීම ගැන තීරණය කරනු ඇත.
- කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.
- තෝරාගත් අයදුම්කරු 2022 සැප්තැම්බර් 01 වන දිනට පත්වීම භාරගැනීමට හැකිවිය යුතු ය.

අයදුම්කරුවන්තම අදාළ පළපුරුද්ද සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ කෙටි සාරාංශයක් ඉදිරිපත් කළ යුතු අතර මෙම තනතුර සඳහා සුදුසු වීමට හේතු දක්විය යුතු ය. වැඩි විස්තර සඳහා පහත සබැඳියට පිවිසෙන්න. http://www.malariacampaign.gov.lk/en/public-notices/vacancies

අයදුම්පත ccmsrilanka@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කළ යුතු අතර විෂය රේඛාවේ "ApplicationforthePostofExecutivesecretary/Oversightofficer,CCMsriLanka" යනුවෙන් සඳහන් කරන්න. අයදුම්පත 2022 ජූලි 10වන දින හෝ ඊට පෙර ලැබිය යුතු ය.

**එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,**
**සභාපති / ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ කමිටුව,**
**ලේකම් / සෞඛ්‍ය අමාත්‍යාංශය,**
**385, පූජ්‍ය බද්දේගම විමලවංශ මාවත, කොළඹ 10.**